**ශීර්ෂය - 296ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය- 296 ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 25 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 25 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. විසින් තවදුරටත් මා,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය<br>වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 1987 ජුනි 20 දිනැති අංක 28 දරන පනතින් සංශෝධිත 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනතේ 11 ඊ වගන්තිය | - | ප්‍රමිතියට පටහැනිව ආනයන සිදු කරන ආනයනකරුවන් ගැසට් පත්‍ර මගින් ප්‍රකාශයට පත් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් එපරදි කටයුතු කර නොතිබුණි. | 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනතේ රෙගුලාසි උල්ලංඝනය කරමින් ආනයන හා අපනයන සිදු කරන ආනයනකරුවන් හා අපනයනකරුවන් අසාධු ලේඛනගත කිරීම සඳහා ගැසට් කෙටුම්පත මේ වන විටත් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් කෙටුම්පත් කර ත්‍රෛභාෂාවෙන් මෙම දෙපාර්තමේන්තුවට එවා ඇත. ඒ සම්බන්ධව ඉදිරි කටයුතු කිරීමට අදාළ උපදෙස් හා නිරීක්ෂණ ලබා ගැනීම සඳහා වෙළඳ හා ආයෝජන තීරුබදු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2023.04.28 දින ලිඛිත ව යොමු කර ඇත. | 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනත අනුව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | 2022 අප්‍රේල් 04 දිනැති අංක 5/2022 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය | - | රජයේ දේපල අස්ථානගතවීම සහ අවභාවිතය වැළැක්වීම මෙන්ම ඒවා උපරිම ඵලදායීභාවයෙන් ප්‍රයෝජනයට ගැනීම තහවුරු කිරීමට ආයතන ප්‍රධානීන්ට නියම කර තිබියදී, එයට පටහැනිව රු.3,038,690 ක පිරිවැයක් සහිත N1SSAN SYLPHY වර්ගයේ මෝටර් රථය ජනාධිපති ලේකම්ගේ අංක PS/IAD/TR/E(1)/Veh .Req-Oth.ins සහ 2022 දෙසැම්බර් 03 දිනැති ලිපියෙන් කරන ලද ඉල්ලීම පරිදි 2022 දෙසැම්බර් 05 දින ජනාධිපති ලේකම් වෙත භාර දී තිබුණි. කෙසේවුවද, මෙම මෝටර් රථය ආයතන අතර විධිමත් වත්කම් හුවමාරුවක් වශයෙන් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | මෙම රථය තාවකාලික හුවමාරුවක් වශයෙන් භාරදී ඇත. වත්කම් පැවරීමක් සිදුකර නැත. අවශ්‍යතාවය මත ඉදිරියේදී එම වත්කම් ආපසු භාර ගැනීමට හෝ පැවරීමට සටහන්කර ගන්නා ලදි. | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ඇ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය | 7,919,375 | ගොඩනැගිලි ඉදිකිරීම, කුලියට ගැනීම හා සියලු වියදම් අඩු කිරීමට රාජ්‍ය ආයතන දැඩිව ක්‍රියාකල යුතු බව දක්වා තිබුණ ද, කුලියට ලබාගත් ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී මුදල් වැය කර තිබුණි. | මෙම දෙපාර්තමේන්තුව, කොළඹ කොටුව යෝක් වීදියේ පිහිටි හේමාස් ගොඩනැගිල්ලේ පලමු මහලේ ඉතා සීමිත ඉඩ ප්‍රමාණයක පවත්වාගෙන යනු ලබන අතර මෙහි සේවය ලබා ගැනීම සඳහා දෛනිකව විශාල සේවාලාභීන් පිරිසක් පැමිණේ. ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති නිසා මෙම | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව කටයුතු කළයුතුය. |

| | | |
|---|---|---|
| | | ගොඩනැගිල්ලේම පහල මාලයේ කොටසක් බදු පදනම මත ලබා ගන්නා ලදි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1969 ජනවාරි 16 දිනැති අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනතින් පිහිටුවන ලද දෙපාර්තමේන්තුවේ අරමුණ, දැක්ම හා මෙහෙවර අනුව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට අහිතකර ලෙස බලපාන ආනයනයන් හා අපනයනයන් පාලනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වුවත් එක් එක් විෂයයන්ට අදාලව රජයේ ආයතන විසින් නිකුත් කරනු ලබන නිර්දේශ මත පදනම්ව පමණක් ආනයන බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර තිබුණි. තවද, දෙපාර්තමේන්තුව පිහිටුවීමේ මූලික අරමුණු ඉටුවන ආකාරයට කටයුතු කිරීම සඳහා පිළිගත් විද්‍යාත්මක ක්‍රමවේදයක් හෝ ක්‍රියාපටිපාටියක් සකස් කර නොතිබුණු අතර බලපත්‍ර ගාස්තු අයකිරීම ප්‍රධාන කාර්යය ලෙස සළකා කටයුතු කරමින් රටෙහි සමස්ථ පාරිභෝජනයෙහි පුරෝකථනයන් සිදු කර ප්‍රමාණ පාලනය (Quality Control) නොකරන බව නිරීක්ෂණය විය. | මෙම දෙපාර්තමේන්තුව 1969 අංක 1 දරණ ආනයන හා අපනයන පාලන පනතට අනුකූල ව රජය විසින් අවස්ථානුකූල ව ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට අනුකූල ව නිකුත් කරනු ලබන රෙගුලාසි අනුව දෙපාර්තමේන්තුවේ අරමුණ, දැක්ම හා මෙහෙවර අනුව කටයුතු කරනු ලබයි. | 1969 ජනවාරි 16 දිනැති අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ දෙපාර්තමේන්තුව පිහිටුවීමේ අරමුණු , හා මෙහෙවර ,දැක්ම අනුව අහිතකර ආනයන හා අපනයනයන් පාලනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් මෘදුකාංග සංවර්ධනය සඳහා අනුමත කරන ලද ආයතන සමඟ මෘදුකාංග පද්ධති සම්බන්ධ කිරීම, ජාලගත වීම හා ජාලගතව අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම වැනි කටයුතු සිදු කිරීම සඳහා ICTA ආයතනය සමඟ 2017 පෙබරවාරි 03 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබූ | දෙපාර්තමේන්තුව දැනට භාවිතා කරනු ලබන පරිගණක පද්ධතිය 2014 වර්ෂයේදී ස්ථාපිත කරන ලද්දකිඑම . පද්ධතිය ආරම්භ කරන අවස්ථාවේදී මාර්ගගත මවේදයක්ක්‍රසඳහා වන පහසුකම් ඇතුළත්ව නොතිබූ බැවින් මාර්ගගත පහසුකම් | සැලසුම් කළ පරිදි නියමිත දිනට කාර්යය ඉටු කරවා ගැනීමට ක්‍රියාකාරීව මැදිහත් වී ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කළ යුතුයි . |

| | |
|---|---|
| නමුත් එම ව්‍යාපෘතිය අපේක්ෂිත පරිදි සමාලෝචිත වර්ෂය තුළදී ද අවසන්ව නොතිබුණි. කෙසේවුවද, බලපත්‍ර නිකුත් කිරීම හා ආනයනයෙන් පසු බලපත්‍රයට අනුකූලව ආනයන සිදුකළ බවට නිශ්කාෂණ කාර්යය (හර කිරීම්) සඳහා 2012 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වසර 10ක් තුල ආයතන කිහිපයක් වෙතින් නව පරිගණක හා උපාංග මිලදී ගැනීම වෙනුවෙන් රු. 6,596, 994 ක් ද, පද්ධතියේ මෘදුකාංග හා අලුත්වැඩියා වෙනුවෙන් රු. 3,089,456 ක් ද වශයෙන් එකතුව රු.9,686,450 ක මුදලක් දරා තිබුණ ද ව්‍යාපෘතිය තවමත් අපේකෂිත මට්ටමින් ක්‍රියාත්මක වී නොතිබුණි. | ඇතුළත් වන පරිදි දෙපාර්තමේන්තු පරිගණක පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා 2016 වර්ෂයේදී කටයුතු ආරම්භ කරන ලදීඑම . කාර්යයන් සිදුකරමින් සිටින අතරතුර තොරතුරු තාක්ෂන නියෝජිත ආයතනය(ICTA) ඔවුන්ගේ පිරිවැය යටතේ මෙම දෙපාර්තමේන්තුවට අවශ්‍ය පරිගණක පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා වන කාර්යය බාරගන්නා ලදීඑසේ . වුවද, ICTA ආයතනය විසින් පරිගණක පද්ධතියේ වැඩිදියුණු කිරීමේ කටයුතු නිවැරදිව අවසන් නොකිරීම හේතුවෙන් එම කටයුතු අතහැර දැමීමට සිදු විය. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) (i) | සී ෂෙල්ස් සිට තායිලන්තය දක්වා ගමන් කළ මත්ස්‍යයින් ගබඩාකළ බහාළුම් රැගත් නෞකාවක් කොළඹ වරායට ආසන්න මුහුදු ප්‍රදේශයේ දී කාර්මික දෝෂයකට ලක්වී විදුලි සැපයුම නතර වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ වරාය අධිකාරිය වෙත 2022 ජනවාරි 13 දින ළඟාවී තිබුණු අතර විදේශීය නෞකාවේ දේශීය නියෝජිතයා මගින් සොයාගත් දේශීය පෞද්ගලික ආයතනයකට කාබනික පොහොර නිෂ්පාදනය සඳහා මෙම මාළු බහාළුම් 2022 මාර්තු 09 දින විකුණා තිබුණි. කෙසේවුවද, 1969 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 08 වන වගන්තිය අනුව රට තුලට ආනයනය | 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 8 වන වගන්තියේ විධිවිධාන අනුව රටතුලට ආනයනය කිරීමට පෙර ආනයන බලපත්‍රය ලබාගත යුතු බව සඳහන් වුවත් එසේ ලබා නොගෙන ආනයනය කර ඇති ද්‍රව්‍ය සඳහා බලපත්‍රයක් ලබානොගෙන ආනයනය කිරීමට අදාළ අතිරේක ගාස්තුවක් අයකර බලපත්‍රයක් නිකුත් කිරීමට බාධාවක් නොමැත. | බලපත්‍ර නිකුත් කිරීමේදී 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිරීමට පෙර ආනයන බලපත්‍රය ලබාගත යුතු වුවද, කාර්මික දෝෂයකට ලක්වීම නිසා පමණක් ලංකාවේ වරායට ළඟා වූ ද්‍රව්‍ය සඳහා පසුව හෙවත් 2022 මැයි 30 දින බලපත්‍රයක් නිකුත් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි. | | |
| (ii) | තවද, බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ආනයනකරු විසින් ඉල්ලීම සිදු කළ යුතු වුවද, එයට පටහැනිව ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම අපහරණ අංශයේ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ විසින් 2022 මැයි 25 දින බලපත්‍රයක් නිකුත්කරන ලෙස සිදුකළ ඉල්ලීම සහ කාබනික පොහොර නිශ්පාදනය කරන දේශීය සමාගම විසින් 2021 දෙසැම්බර් 10 දිනැති පෙර දාතම් කරන ලද ව්‍යාජ වාණිජ ඉන්වොයිසියක් ඉදිරිපත් කර තිබුණද, බලපත්‍රය නිකුත් කිරීමේදී එය ආනයන හා අපනයන පාලන ජනරාල්ගේ අවධානයට ලක් වී නොතිබුණි. | Eco N Rich Organic Fertilizer ආයතනය එනම් ආනයනකරු විසින් බලපත්‍රයක් ලබාගැනීම සඳහා 2022.05.26 දින දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇති අයදුම්පත මගින් ඉල්ලීමක් කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම අපහරණ අංශයේ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ විසින් 2022.05.25 දින සිදුකරන ලද ඉල්ලීම පමණක් සලකා බලපත්‍රය නිකුත් කිරීමට කටයුතු කර නොමැති බව සඳහන් කළ හැක.<br>එමෙන්ම ආනයනකරුවන්ට රේගු නිෂ්කාශන කටයුතු වලදී අදාළ ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. එහෙයින් එකී මුල් පිටපත් සමඟ අනු පිටපත් පරීක්ෂා කිරීමෙන් පසු ආනයන බලපත්‍ර ලබාදීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීම සාමාන්‍ය ක්‍රමවේදය වේ. | බලපත්‍ර නිකුත් කිරීමේදී 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (iii) | ගුණත්වයෙන් ඉහල භාණ්ඩ ආනයනය පිළිබඳව සැලකිලිමත්වීම ආනයන අපනයන පාලන ජනරාල්ගේ කාර්යභාරයක් වුවද, වරායට ළඟාවන අවස්ථාව වන විටත් මෙම මාළු තොගය නරක් වී අධික දුර්ගන්ධයකින් යුක්ත හා පරිසරයට හානිවන තත්ත්වයක පැවතියදී දෙපාර්තමේන්තුව | ගුණත්වයෙන් ඉහළ භාණ්ඩ ආනයනය පිළිබඳව සැලකිලිමත් වීම ආනයන හා අපනයන පාලක ජනරාල්ගේ කාර්යභාරය වුවත් එම භාණ්ඩවල ගුණාත්මක තත්ත්වය පිළිබඳ නියාමන කාර්යය ඉටු කරනු ලබන්නේ එම භාණ්ඩය සම්බන්ධ වන රාජ්‍ය ආයතනය වේ.එනම් එම භාණ්ඩ නිදහස් කිරීමට මෙම දෙපාර්තමේන්තුවට නිර්දේශය ලබාදෙන ආයතනය වේ. | ගුණත්වයෙන් ඉහල භාණ්ඩ ආනයනය පිළිබඳව ආනයන අපනයන පාලන ජනරාල් සැලකිලිමත් විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | බලපත්‍රය නිකුත් කිරීමට කටයුතු කර තිබුණි | දෙපාර්තමේන්තුව සතු කාර්යයක් නොවේ. එසේ වුවත් කොන්දේසි කිහිපයකට යටත්ව Eco N Rich Organic Fertilizer ආයතනය වෙත මාළුන්ගේ ඉවතලන කොටස් ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර ඇත.<br>තව ද ශ්‍රී ලංකා රේගුව විසින් මේ සම්බන්ධයෙන් පත්කරන ලද කමිටුව මගින් මෙම අයිතමය 0511.91.10 යටතේ බලපත්‍ර පාලනයට යටත් අයිතමයක් ලෙස හඳුනාගැනීමෙන් පසු එම කමිටු තීරණය මත පිහිටා මෙම ඉවතලන මාළු කොටස් මනුෂ්‍ය පරිභෝජනයට නොව දියර කාබනික පොහොර සෑදීම සඳහා ලබාදීමට බලපත්‍ර නිකුත් කිරීමක් සිදුකර ඇත. | |
| (ආ) | රටේ ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගෙන භාණ්ඩ ආනයනය පාලනය සම්බන්ධයෙන් තම කාර්යයභාරය ඉටුකල යුතු බවට දෙපාර්තමේන්තු මෙහෙවර ප්‍රකාශයේ සඳහන් වූ නමුත් විදේශ විනිමය අර්බුදයක් රටතුල පවතින අවස්ථාවක සහ එතනෝල් ආනයනය සීමා කර තිබිය දී ඩොලර් 1,960,000 ක වටිනාකමකට ලංකා සීනි සමාගමට එතනෝල් නිෂ්පාදනයට අවශ්‍ය මොලැසස් ආනයනය සඳහා ආනයන බලපත්‍රයක් 2022 ජනවාරි 21 දින නිකුත් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි. | රටට අවශ්‍ය එතනෝල් රට තුළම නිපදවා ගැනීමේ අරමුණින්, සුරාබදු දෙපාර්තමේන්තුවේ නිර්දේශ පරිදි, 2020.01.01 දින සිට එතනෝල් ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම අත්හිටුවන ලදී. ඒ අතරම දේශීයව එතනෝල් නිෂ්පාදනය සඳහා සීනි නිෂ්පාදනයේ අතුරුඵලයක් ලෙස ලැබෙන මොලැසස් භාවිත කර එතනෝල් නිෂ්පාදනය කිරීම පැල්වත්ත සහ සෙවනගල සීනි සමාගම් විසින් සිදු කරයි.<br>නමුත් 2021 වර්ෂය සඳහා ඉලක්කගත එතනෝල් ලීටර් මිලියන 12.5ක ප්‍රමාණය නිෂ්පාදනය සඳහා අවශ්‍ය මොලැසස් හිඟයක් පවතින බැවින් එම හිඟය මගහරවා ගැනීමට ලංකා සිනි සමාගම විසින් මොලැසස් ආනයනය කිරීමට අවසර ඉල්ලන ලදි. | තම කාර්යයභාරයන් ඉටුකිරීමේදී දෙපාර්තමේන්තු මෙහෙවර ප්‍රකාශයට අනුගත විය යුතුය. |

| | | |
|---|---|---|
| | ඒ සඳහා සුරාබදු දෙපාර්තමේන්තුවේ 2022.01.19 දිනැති Molasses Import දරන ලිපිය මගින් නිර්දේශ ලබා දී තිබූ අතර, 2021.05.05 දිනැති අංක PS/EDC/MA2/01(ii) දරන ලිපිය මගින් ජනාධිපති ලේකම් විසින් ඉහත සඳහන් කරන ලද ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කරන ලෙස ද උපදෙස් ලබා දී තිබුණි. | |

**4. යහපාලනය**

**4.1 රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඵලදායී තොරතුරු තාක්ෂණික පද්ධතීන් උපයෝගී කර ගනිමින් රජයේ ආදායම එකතු කිරීම, වැඩිදියුණු කිරීම සඳහා පාර්ශවකරුවන් විසින් සහ පාර්ශවකරුවන් අතර ගත යුතු පියවර නිර්දේශ කිරීම සඳහා වූ 2016 නොවැම්බර් මස 23 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අතුරු වාර්තාවේ නියෝග පරිදි “ආයතන විසි අටක සම්බන්ධීකරණය ඇතිව, බලපත්‍ර නිකුත් කිරීමේදී අදාල ආයතන වෙතින් අන්තර්ජාලය ඔස්සේ නිර්දේශ ලිපි ලබා ගැනීමට සැලසුම් සකස් කළ යුතු බව දන්වා” තිබුණද එම නිර්දේශය විගණන දිනය වූ 2023 මාර්තු 23 වන විටත් ක්‍රියාත්මක වී නොතිබුණි. | 2016 නොවැම්බර් 23 දින පැවති රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේදී ප්‍රකාශ කරන ලද්දේ ඒ වන විට සැලසුම් කර තිබූ වැඩසටහනට අනුව තත්වයන්ය. මෙම වැඩසටහන් සකස් කිරීම 2017 වර්ෂයේදී ICTA ආයතනය විසින් ඔවුන්ගේ පිරිවැය යටතේ ඉටු කර දීමේ වගකීම භාර ගෙන තිබුනි. එසේ වුවද මෙම ආයතනය විසින් පරිගනක පද්ධතිය වැඩි දියුණු කිරීමේ කටයුතු නිවැරදිව අවසන් නොකිරීම හේතුවෙන් එම කටයුතු අතහැර දැමීමට සිදුවිය. එබැවින් දෙපර්තමේන්තුව විසින් මාර්ගගත පරිගනක පද්ධතියක් වැඩි දියුණු කිරීමේ කටයුතු නැවත ආරම්භ කරන ලද අතර, ඒ අනුව ඇමරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය යටතේ ක්‍රියාත්මක EXBS වැඩසටහන වෙතින් ප්‍රදානයක් වශයෙන් මාර්ගගත පරිගණක පද්ධතියක් ලබා දීමට එකගතාවය පල කල අතර එම වැඩසටහන සකස් | රාජ්‍ය ගිණුම් පිළිබද කාරක සභා නියෝගයන්ට අනුකූල විය යුතුය. |

| | | |
|---|---|---|
| | කිරීමේ කටයුතු 2023 අප්‍රේල් මස සිට ආරම්භ කරන ලදි. මෙම පරිගනක පද්ධතිය සකස් කිරීමෙ කටයුතු 2024 පෙබරවාරි මස වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇති අතර එම වැඩසටහන යටතේ නිර්දේශ ලබා දුන් ආයතන මාර්ගගතව සම්බන්ද කිරීම සඳහා කටයුතු සුදානම් කර ඇත. | |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යය මණ්ඩලය 111 වන නමුත් තථ්‍ය කාර්යය මණ්ඩලය 92 ක් ව පැවති අතර එදිනට නියෝජ්‍ය/සහකාර පාලක, නීති නිලධාරි සහ සහකාර අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ යන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03 ක් පුරප්පාඩුව පැවතුණි. තවද තෘතියික මට්ටමේ නිලධාරින් 02 ක්, ද්විතියික මට්ටමේ නිලධාරින් 12 ක් සහ ප්‍රාථමික මට්ටමේ නිලධාරි 02 ක් පුරප්පාඩුව පැවතුණි. | තනතුරු බොහොමයක් දීප ව්‍යාප්ත සේවා වලට හා ඒකාබද්ධ සේවාවන්ට අයත් වන අතර අදාළ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. ඒ අනුව මේ වන විට අදාල පුරප්පාඩු සම්පූර්ණ කරමින් පවතී.<br>තවද නීති නිලධාරී දෙපාර්තමේන්තු ගත තනතුරක් බැවින් මේ වන විට බඳවාගැනීමේ පටිපාටි සකස් කරමින් පවතී. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා වූ පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුය. |